## උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ - පළාත් සංරචකය 2012

---

1. **මතය.**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන.**

2.1 **මූල්‍ය කාර්ය සාධනය.**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.780,930,315 ක් වූ අතර, 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,481,263,816 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, පසුගිය වර්ෂය සඳහා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම 2012 | 2011 | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 756,041,451 | 530,254,792 | 1,436,296,242 |
| ස්ථාවර වත්කම් | 143,500 | 3,179,095 | 3,396,371 |
| ණය පොලී | 9,912,013 | 3,032,215 | 12,944,228 |
| ව්‍යාපෘති කළමනාකරණ පිරිවැය | 14,833,351 | 11,265,681 | 28,626,975 |
| එකතුව | 780,930,315 | 547,731,783 | 1,481,263,816 |

2.2 **අග්‍රිම අරමුදල් ගිණුම.**

මූලා ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා 2012 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 511,490 | 58,259,403 |
| එකතු කළා - ඌන පුරණයන් | 1,813,411 | 223,569,089 |
| විදේශ විනිමය වාසිය | - | 3,520,862 |
| | 2,324,901 | 285,349,354 |
| අඩු කළා - ආපසු ගැනීම් | 2,307,247 | 283,104,449 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 17,654 | 2,244,905 |

**3.** **විගණන නිරීක්ෂණ**

පහත නිරීක්ෂණයන් කෙරේ.

**3.1** **සැළසුම් කිරීම සහ අධීක්ෂණය**

සියලු ව්‍යාපෘති සංරචක ඇතුලත් වන පරිදි සහ මූලා සහ භෞතික ඉලක්කයන් සමග මාසික, කාර්තුමය සහ අර්ධ වාර්ෂිකව වගකීම් නියම කරමින් සම්පූර්ණ ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි වෙන් කරන ලද අරමුදල් යොදා ගනිමින් ව්‍යාපෘති කාලය තුල ව්‍යාපෘති අරමුණු ලඟාකර ගැනිම සහතික කිරීම සඳහා විස්තරාත්මක ක්‍රියාකාරී සැළැස්මක් පිළියෙල කල යුතුවේ.කෙසේ නමුත් එවැනි සැළැස්මක් 2013 සැප්තැම්බර් 30 වන විටද පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.2** **සම්බන්ධීකරණ දීමනා ගෙවීම.**

2012 වර්ෂය සඳහා සම්බන්ධීකරණ දීමනා ලෙස උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්, යටිතල පහසුකම් අමාත්‍යාංශ ලේකම් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මුදල් වෙත රු. 360,000 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ.

ඝ- ව්‍යාපෘති කාර්යයන් සම්බන්ධීකරණය සඳහා දීමනා ගෙවා තිබුණද මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සහභාගී වීම පිළිබඳව හැර, කාර්යයන් සම්බන්ධීකරණය කළ බවට අදාල සාක්ෂි එනම් කරන ලද කාර්යයේ ස්වභාවය සහ විස්තරය, ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා නිළධාරින් ගත කළ දින ගණන විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ xv වැනි පරිච්ඡේදයේ 133 වගන්තිය සංශෝධනය කරන ලද 2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත අනුව මසකට රු. 50,000 වඩා සම්බන්ධීකරණ දීමනා ලබන නිළධාරීන්ගෙන් උපයන විට ගෙවීම් බදු අඩු කර නොතිබුණි.

## 3.3 මුල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය.

### 3.3.1 අරමුදල් උපයෝජනය.

ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ඔක්තෝබර් මස ආරම්භ කර එජඩො මිලියන 27.16 කට සමාන ශ්‍රී ලංකා රුපියල් මිලියන 3,530.8 ක මුලු පිරිවැයක් දරා 2015 ජුනි 30 නිම කිරීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල අරමුදල් මුල්‍යානය, අයවැය වෙන්කිරීම් සහ සමාලෝචිත වර්ෂය තුල අරමුදල් උපයෝජනය සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අයවැය වෙන් කිරීම් සහ තථ්‍ය අරමුදල් උපයෝජනයන්ට අදාල සමහර වැදගත් සංඛ්‍යා පහත දැක්වේ.

| | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුලු පිරිවැය | | 2012 වර්ෂය සඳහා අයවැය වෙන්කිරීම් | 2012 වර්ෂය තුල අරමුදල් උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දක්වා සමුච්චිත අයවැය වෙන්කිරීම් | 2012 දෙසැම්බර් 31 දක්වා සමුච්චිත අරමුදල් උපයෝජනය |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලි. | රු. මිලි. | රු. මිලි. | රු. මිලි. | රු. මිලි. | රු. මිලි. |
| ආසබැ | 24.4 | 3,172.0 | 792 | 700.7 | 1,366 | 1,318.4 |
| ශ්‍රීලංර | 2.76 | 358.8 | 81 | 80.2 | 166 | 162.8 |
| | 27.16 | 3,530.8 | 873 | 780.9 | 1,532 | 1,481.2 |

### 3.3.2 භෞතික කාර්ය සාධනය.

උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය දුර කිලෝමීටර් 140.81 ක් වු මාර්ග ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් වටිනාකම රු.1,893,458,068 ක් වූ මාර්ග පැකේජ 06 ක් කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙකු වෙත ප්‍රදානය කර තිබුණි. පහත දැක්වෙන පරිදි දුර කිලෝමීටර් 106 ක් වු මාර්ග පැකේජ 04 ක ඉදිකිරීම් දුර්වල මට්ටමක පවතින බව නිරික්ෂණය විය.

| මාර්ග පැකේජය | මාර්ගයේ මුළු දුර කිමී. | නිමකිරීමට නියමිත දිනය | සංශෝධිත නිමකිරීමට නියමිත දිනය | 2012 දෙසැම්බර් 31 දිනට නිමකළ ප්‍රතිශතය | 2013 ජුලි 31 දිනට නිමකළ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | | | % | % |
| (i) එන්පී01-එන්පීඑම්ජ්සී001 | 3.71 | | | 98.72 | 100 |
| -එන්පීඑම්ජ්සී005 | 5.07 | | | 99.57 | 100 |
| -එන්පීඑම්ජ්සී007 | 3.48 | | | 90.75 | 100 |
| -එන්පීඑම්ජ්සී010 | 2.00 | | | 100.00 | 100 |
| -එන්පීඑම්ජ්සී020 | 0.84 | | | 100.00 | 100 |
| (ii) එන්පී02-එන්පීජ්එම029 | 26.96 | 2013.02.10 | 2013.10.31 | 44.10 | 58 |
| (iii) එන්පී03- මාර්ග 9 | 16.23 | | | 100.00 | 100 |
| (iv) එන්පී04-එන්පීවීජ්සී027 | 5.98 | 2013.02.09 | 2013.05.25 | 93.90 | 98 |
| -එන්පීවීජ්සී029 | 10.20 | 2013.02.09 | 2013.05.25 | 66.66 | 91 |
| -එන්පීවීජ්සී034 | 9.68 | 2013.02.09 | 2013.05.25 | 73.85 | 96 |
| (v) එන්පී05-එන්පීවීජ්සී007 | 15.33 | 2013.02.09 | 2013.05.23 | 39.35 | 80 |
| -එන්පීවීජ්සී010 | 13.91 | 2013.02.09 | 2013.05.23 | 25.44 | 67 |
| (vi) එන්පී06-එන්පීවීජ්සී014 | 24.14 | 2013.02.09 | 2013.05.23 | 29.12 | 52 |
| -එන්පීවීජ්032 | 3.28 | | | 98.94 | 100 |
| | 140.81 | | | | |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ). කොන්ත්‍රාත් පැකේජ හයෙන් මුළු මාර්ග දිගින් සියයට 75.28 ක් නියෝජනය කරන කිලෝ මීටර් 106 ක් දිග පාරවල්වලින් සමන්විත පැකේජ හතරක කාර්ය සාධනය ඉලක්කයට වඩා පහල මට්ටමක පැවතුණි.

(ආ). කොන්ත්‍රාත් පැකේජ හතරක සංශෝධිත ඉලක්කගත දිනයන් 2013 මැයි මස නිම වුවද, 2013 ජුලි 31 දිනට මෙම පැකේජවල කාර්යය සාධන මට්ටම සියයට 58 ත් සියයට 98 ත් අතර පරාසයක පැවතුණි.

(ඇ). කොන්ත්‍රාත් ගෙවීම්වලින් අයකර ගත යුතු ප්‍රමාද ගාස්තු අලාභ කොන්ත්‍රාත්කරුවන්ට කොටස් ගෙවීමේදී අයකර ගෙන නොතිබුණි.

### 3.3.3 ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම

2012 දෙසැම්බර් 31 දිනට වසර 02ක කාලපරිච්ඡේදයක් ගතවී තිබුණද උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා ව්‍යාපෘති අරමුදල් භාවිතා කරමින් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙහි එක් සංරචකයක් හෝ ක්‍රියාත්මක කිරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.